# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

ඩබ්ලිව්.ජේ.උදය කුමාර
ගීකියනගෙදර,
පිටවල,
නාවලපිටිය

**අභියාචක**

**අභියාචනා අංකය : 842/2021**

එදිරිව

මාර්ග සංවර්ධන අධිකාරිය
මග නැගුම මහා මැදුර
නො. 216,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත,
බත්තරමුල්ල

**පොදු අධිකාරිය**

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක දු:ක අංක 071-4412235 ඔස්සේ සම්බන්ධ වේ.
පොදු අධිකාරිය වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ තොරතුරු නිලධාරි ආර්.ඒ.ආර්.පී.එන් බන්ඩාර මහතා පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - 2022.01.06
පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත.

**විභාග කළ දිනය** : 2022.04.06

**තීරණය කළ දිනය** : 2022.04.06

**<u>තීරණය :</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2020.12.30 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

*"මාර්ග සංවර්ධන අධිකාරිය සංවර්ධන ව්‍යාපෘතිය සිදු කළ ආකාරය (2015 ඔක්තෝබර්)"*

ඒ අනුව, තොරතුරු නිලධාරි විසින් 2021.01.06 දිනැතිව පහත පරිදි ප්‍රතිචාර දක්වා ඇත.

> *"...එවකට උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශයේ ප්‍රතිපාදන හමුවේ හඟරාපිටිය නීලවතුකන්ද මාර්ගය 2015 වර්ෂයේ ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන මඟින් මෙම අධිකාරියේ උපකාරක හා අධීක්ෂණ සේවාවන් හමුවේ සංවර්ධනය කරන ලද මාර්ගයක් වේ. එහි ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව මෙම අධිකාරිය හා ගිවිසුම්ගතව හැටන්, හඟරාපිටිය,ගැටගහවත්ත, පුබුදු ග්‍රාම සංවර්ධන මඟින් සිදු කරන ලදී. ඒ අනුව අදාළ සමිතිය විසින් එකී මාර්ග කර්මාන්තය අප අධීක්ෂණය යටතේ සිදු කරන ලද අතර මාර්ග සංවර්ධන කටයුතු වලින් පසුව අදාළ වැඩ කොටස සඳහා මුදල් ඉල්ලා සිටින ලදී. ඒ අනුව මාර්ග කර්මාන්තය තත්ත්ව පාලන සහතිකයට ලක්කර සුදුසු තත්ත්වයේ පැවතීම මත ඉහත කී සමිතිය වෙත කළ කර්මාන්ත කොටස වෙනුවෙන් මුදල් නිර්දේශ කර අමාත්‍යාංශය වෙත යොමුකළ අතර අමාත්‍යාංශය මඟින් සමිතියේ බැංකු ගිණුම වෙත චෙක්පත් මාර්ගයෙන් ගෙවීම කරන ලදී*
>
> *අනතුරුව මාස 06ක් ඉක්ම ගිය පසු රඳවුම් මුදල් ඉල්ලා සිටි අතර ඒ සඳහා ද ඉහත කී ක්‍රමවේදය අනුව අදාළ සමිතියේ බැංකු ගිණුම වෙත චෙක්පත් මාර්ගයෙන් අමාත්‍යාංශය මුදල් බැරකර ඇත. ඒ අනුව සියළු මාර්ග සංවර්ධන කටයුතු හා ඒ සබැඳි ගනුදෙනු අදාළ සමිතිය වෙත නිසි ලෙසින් ඉටු කර ඇත.*
>
> *ඔබගේ 2020.10.26 දිනැති ලිපියේ අජිත් බණ්ඩාර යන අය සේවා දායකත්වය සඳහා නිසි පරිදි ගෙවීම් කර නොමැති බවත් වංචනික ලෙසින් රඳවුම් මුදල් ලබාගත් බවත් පවසයි. මෙම අධිකාරිය අදාළ ගිවිසුම්ගත සමිතිය සමඟ පමණක් ගනුදෙනු කටයුතු සිදු කරනු ලබන හෙයින් සමිතිය විසින් බාහිර පාර්ශවයන් සමඟ කරනු ලබන කටයුතු සඳහා වගකීම් දරනු නොලබන වගකීමක් දරනු නොලබන බවත් කාරුණිකව දන්වා සිටිමි.*
>
> *තවද, ඔබ විසින් ඉදිරිපත් කරන ලද හඟරාපිටිය නිලවතුකන්ද අතුරු මාර්ගය සංවර්ධනය කිරීම පිළිබඳ යොමුගත ලිපියේ ප්‍රකාරව ඔබ විසින් ඉදිරිපත් කරන ලද ගැටළු සඳහා විස්තර පහත සඳහන් පරිදි වේ.*
>
> > *1. මූල්‍ය ප්‍රතිපාදන ලබාගත් ආකාරය*
> >
> > *මෙය 2015 වර්ෂයේ මගනැගුම ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩ සටහන යටතේ මහා මාර්ග අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන වෙන් කිරීමෙන් අනතුරුව අංක Eo/06/15/CC/26 ඉහත මාර්ගය සංවර්ධනය සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර ඇත.*
> >
> > *2. වැලි මැටල් සිමෙන්ති ලබාගත් ආකාරය කෙසේද? යන්නත් විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව කොන්ක්‍රීට් දැමූ ආකාරයත්*

*ඉහත කී අදාළ ඉදිකිරීම් ද්‍රව්‍ය සපයාගැනීම හා මාර්ගය සංවර්ධනය කිරීම ගිවිසුම් ගත සමිතිය වන හැටන් හගරාපිටිය පුබුදු ග්‍රාමසංවර්ධන සමිතිය මගින් සිදු කළ යුතුවේ. මාර්ග සංවර්ධනය අපගේ නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදුකළ අතර තත්ත්ව පරීක්ෂණය යටතේ සිදුකළ අතර තත්ත්ව පරීක්ෂණය වාර්තා මගින් එහි නිරවද්‍යතාවය තහවුරු කර ඇත. (වාර්තාවේ පිටපත අමුණා ඇත.)*

*3. ඉදිකිරීම් ද්‍රව්‍ය හා සේවා දායකත්වය සඳහා ගෙවීම් නිසි පරිදි සිදු කලේද යන්නත්*

*මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගිවිසුම් ගත සමිතිය සමඟ පමණක් ගනුදෙනු හා සියළු කටයුතු සිදු කරනු ලබන ඒ අනුව අදාල කාර්ය කළ එකී සමිතිය වෙත කළ කාර්ය කොටස වෙනුවෙන් නිසි පරිදි සියලු මුදල් අමාත්‍යාංශය හරහා ගෙවීම් කර ඇත.*

*4. වසරකට පසුව ලැබෙන රඳවුම් මුදලට සිදුවූයේ කුමක්ද?*

*වසරකට පසුව නොව රඳවුම් මුදල් ලබාදෙනු ලබනුයේ මාස 06 කින් අනතුරුව වේ. ඒ සඳහා ගිවිසුම්ගත සමිතිය විසින් විධිමත් පරිදි ඉල්ලීම සිදු කළ යුතුවේ. එහිදී කරුණු සළකා බලා යෝග්‍ය වේ නම් පමණක් රඳවුම් මුදල ගෙවනු ලැබේ. මෙම මාර්ග සංවර්ධන නිසි ලෙස ඉටු කිරීම හේතුවෙන් අදාළ සමිතිය වෙත රඳවුම් මුදල නිදහස් කර ඇත.*

*ඒ අනුව, ඔබගේ ලිපියේ කළ ඉල්ලීම් 4 සඳහා පිළිතුරු එසේ වන අතර එහි එක් ඡේදයක අතරමැදියෙකු සහ සභාපති විසින් මුදල් ලබා ගත ආකාරයත් රඳවුම් මුදල් වංචනික ලෙසින් ලබාගත් බවත් පවසා සිටී.*

*අප විසින් කළ කාර්ය උදෙසා විධිමත් පරිදි සියළු ගෙවීම් අදාල සමිතිය වෙත නිදහස් කර ඇති අතර වෙනත් කිසිදු ගනුදෙනුවක් පිළිබඳව හෝ එකී මුදල් පරිහරණය පිළිබඳව කිසිදු බැඳීමක් නොවන වග අවශ්‍ය කටයුතු සඳහා කාරුණිකව දන්වා සිටිමි.*

*ඔබ විසින් ඉදිරිපත් කළ ලිපි මඟින් බලාපොරොත්තුවන මුඛ්‍යාර්ථය පැහැදිලි නොවන හෙයින් ඔබ විසින් පවසා සිටි දුරකථන අංකයෙන් අදාළ වයි.ජී.ප්‍රේමරත්න යන අය 2021.01.05 දින සම්බන්ධ කර ගත අතර අදාළ අය විසින් සියළු මුදල් සමිතිය වෙත ලැබුන බවත් ඔබ ගැන හෝ ඔබගේ ලිපියේ සඳහන් කරුණු පිළිබඳ තොරතුරු කිසිවක් තමන් නොදන්නා බවත් පවසා සිටී.*

*ඔබ වෙත තවත් තොරතුරු අවශ්‍යවේ නම් සතියේ දිනෙක රාජකාරී කාල සීමාව තුළ මෙම කාර්යාලය වෙත පැමිණ අවශ්‍ය තොරතුරක් ලබාගන්නා ලෙස දන්වා සිටිමි. තවද ඔබ විසින් යම් නෛතික තීරණයන් උදෙසා කටයුතු කරන්නේ නම් ඒ අවස්ථාවන් හිදී අදාළ පාර්ශවය වෙත මෙම තොරතුරු ලබාදීමේ හැකියාවක් පවතින අතර RTI 01 අයදුම් පතේ සඳහන් ආකාරයට මෙම අධිකාරිය කිසිදු පොලිස් පරීක්ෂණයක් සඳහා කැඳවා නොමැති බවත් අවශ්‍ය කටයුතු සඳහා කාරුණිකව දන්වා සිටිමි.”*

එකී පිළිතුරු වලින් අතෘප්තියට පත් අභියාචක විසින් 2021.01.15 දිනැතිව නම්කළ නිළධාරී වෙත අභියාචනයක් යොමු කර ඇත. ඒ අනුව, නම්කළ නිළධාරි විසින් 2021.01.26 දිනැතිව ප්‍රතිචාර දක්වමින් පවසා ඇත්තේ,

*"ඔබ වෙත ඔබ විසින් මීට ඉහත දී ඉල්ලීම් කළ සියළු තොරතුරු මේ වන විටත් මා විසින් සපයා ඇති අතර තවදුරටත් විස්තර අවශ්‍ය වන්නේ නම් සතියේ දිනෙක රාජකාරී කාල සීමාව තුළ මෙම කාර්යාලය වෙත පැමිණ ලබා ගන්නා මෙන් මෙයින් දන්වා සිටිමි."* යනුවෙනි.

එකී ප්‍රතිචාරයෙන් ද අතෘප්තියට පත් අභියාචක 2021.08.02 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

අභියාචක විසින් 2022.01.06 දිනැතිව කොමිෂන් සභාව වෙත පහත පරිදි ලිඛිත කරුණු දැක්වීම් සිදු කර ඇත.

*"නඩු අංක 13917 සහ නඩු අංක 14362 යටතේ මේ වන විටදී හැටන් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 2ක් විභාග වෙමින් පවතින බැවින් ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කිරීම සඳහා මෙම ව්‍යාපෘතියට අදාළව තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය බවත් එම තොරතුරු වලට අදාළව ලිඛිත නියෝගයක් ලබාදීමෙන් ඉල්ලා ඇති තොරතුරු සියල්ලම ලබාදීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙසද වැඩි දුරටත් දන්වා සිටිමි."*

## සළකා බැලීම

අභියාචක විසින් තොරතුරු ඉල්ලීමක් 2020.12.30 දින සිදු කර ඇත. එකී තොරතුරු ඉල්ලීමට ඉහත පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි විසින් ක්‍රියා කර ඇති අතර 2021.01.06 දිනෙන් තොරතුරු නිලධාරිගේ ප්‍රතිචාරය අභියාචක වෙත යවා ඇත. මෙම ප්‍රතිචාරය කොමිෂන් සභාව විසින් සළකා බලන ලදී. ඒ අනුව එකී ප්‍රතිචාරය අභියාචකගේ තොරතුරු ඉල්ලීමට ප්‍රමාණවත් අයුරින් සිදු කර ඇති බැවින් මෙම අභියාචනය අවසන් කිරීමට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිලධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.